EDR/PE/2024/2128.

සුනිල් හඳුන්නෙත්ති
464/20,
පන්නිපිටිය පාර,
පැලවත්ත,
බත්තරමුල්ල

EDR
30 AUG 2024

2024.08.30

මැතිවරණ කොමසාරිස්,
මැතිවරණ ලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

ගරු කොමසාරිස්තුමනි,

<u>විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය පාවිච්චි කිරීමට නො එන ලෙස රාජිත සේනාරත්න සිදු කළ තර්ජනය</u>

ස්වාධීන අපේක්ෂක, රනිල් වික්‍රමසිංහ සමඟ එක්වී සිටින සමගි ජන බලවේගයේ කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, රාජිත සේනාරත්න විසින් විදේශගත ශ්‍රී ලාංකිකයන් ජනාධිපතිවරණයේ දී ඡන්දය භාවිත කිරීමට පැමිණීම වැළැක්වීම සඳහා තර්ජනාත්මක ප්‍රකාශයක් මාධ්‍ය හමුවේ සිදු කර තිබේ. එය TTV News යූටියුබ් නාළිකාව මඟින් 2024.08.28 වැනි දින අන්තර්ජාලයට මුදාහැර ඇත. ඉහත සඳහන් ප්‍රකාශයට මෙම සබැඳිය හරහා ප්‍රවේශ විය හැක - https://youtu.be/1ZDAaerZ1qM?si=bu33h221weMM5hR1

රාජිත සේනාරත්න එහි දී තර්ජනය කර තිබෙන්නේ "එන්න එපා තොපි එකෙක්වත්, රට ඉඳන් අනුරට ඡන්දය දෙන්න. අපට ඇරලා ගිහින්, තමුසෙලා කකා බිබී ඉන්නවා" ආදී වශයෙන් ප්‍රකාශ කර ඇත.

මේ වන විට විදෙස්ගත වී සිටින නමුත්, සැප්තැම්බර් 21 වැනි දින ඡන්දය භාවිත කිරීමේ පරමාධිපත්‍ය බලය වෙනුවෙන් හිමිකම් කියන මිලියන කිහිපයක පුරවැසියන් හට මෙමඟින් තර්ජනය කර තිබේ. නිදහස් හා සාධාරණ මැතිවරණයක් වෙනුවෙන් මෙවැනි තර්ජන සිදු කිරීම, විශේෂයෙන්ම වර්තමාන අනුප්‍රාප්තික ජනාධිපතිවරයා ද වන රනිල් වික්‍රමසිංහ සමඟ එක් වී සිටින නිසා මෙම තර්ජනය කිසිසේත්ම නොතකාහැරිය නොහැකි ය.

මෙම තර්ජනය 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතෙහි iv කොටසෙහි 78(1) වගන්තිය උල්ලංඝනය කරමින්, අයුතු බලපෑම් සිදු කිරීමක් ය.

විශේෂයෙන්ම මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත් වී සිටින ජාතික ජන බලවේගයේ අපේක්ෂක, අනුර කුමාර දිසානායකගේ නම සඳහන් කරමින්, තර්ජනය කිරීමෙන් වක්‍රව මෙය අනුර කුමාර දිසානායකට ඡන්දය දීමට ශ්‍රී ලංකාවට නො එන ලෙස සිදුකල තර්ජනාත්මක ප්‍රකාශයකි.

ස්තූතියි

මෙයට

සුනිල් හඳුන්නෙත්ති